**ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සෞභාග්‍යමත් වයඹ ජනතාවක්.

### 1.2 මෙහෙවර

වයඹ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම පිණිස මානව, මුල්‍ය හා භෞතික සම්පත් කාර්යක්ෂමව මනා ඵලදායීව හැසිරවීමට නායකත්වය දීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 25,538.54 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 23,654.10 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,884.44 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7.38 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 20,829.14 | 20,822.75 | 6.39 | 0.03 |
| මූලධන | 4,709.40 | 2,831.35 | 1,878.05 | 39.88 |
| **එකතුව** | **25,538.54** | **23,654.10** | **1,884.44** | **7.38** |

## 3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.